DNW
FNA in co-ordination with DN(P&P)
21/4

(53)


| | | | |
|---|---|---|---|
| කැ.පෙ.<br>த.பெட்டி<br>P.O. Box | 572 | මගේ අංකය<br>எனது இல<br>My No | MOD/DEF/GS/SALW/3<br>SLA |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 2430860-9<br>2430870-8 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | |

ආරක්ෂක අමාත්‍යාංශය, අංක: 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව
பாதுகாப்பு அமைச்சு, இல 15/5, பாலதக்ஷ மாவத்தை, கொழும்பு -03, இலங்கை.
**MINISTRY OF DEFENCE**, No:15/5, Baladaksha Mawatha, Colombo 03, Sri Lanka


SSO(W)

NAVAL WELFARE DIRECTORATE
23 APR 2019 (08)
RECEIVED

DDO (W)
DPK to MA

NAVAL HEADQUARTERS
13 APR 2019
SECRETARIAT

දිනය
திகதி
Date
2019.04.16

Director General Services
Naval Headquarters
Date 20/04/2019
Sec.......
DG(S).......

යුද්ධ හමුදාධිපති,

නාවික හමුදාධිපති,

ගුවන් හමුදාධිපති,

## ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දුබලතාවයට පත්ව එකී දුබලතා ප්‍රතිශතය 50% ට අඩුවීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/1982/(305)(09) යටතේ ප්‍රතිලාභ නොලබා අදාළ සේවා කාලය සම්පූර්ණ කොට විශ්‍රාම ගොස් හෝ අස්ව සිටින ත්‍රිවිධ හමුදා සේවා පුද්ගලයන් වෙත හිඟ වැටුප් ගෙවීම

ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දුබලතාවයට පත්ව එකී දුබලතා ප්‍රතිශතය 50% ට අඩුවීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/1982/(305)(09) යටතේ ප්‍රතිලාභ නොලබා අදාළ සේවා කාලය සම්පූර්ණ කොට විශ්‍රාම ගොස් හෝ අස්ව සිටින ත්‍රිවිධ හමුදා සේවා පුද්ගලයන් 792 දෙනාට සහ ඉදිරියේදී හඳුනා ගන්නා මෙම ගණයට අයත් සේවා පුද්ගලයන් වෙත හිඟ වැටුප් ගෙවීම සඳහා අමප/19/0322/403/020 හා 2019.02.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් පහත පරිදි අනුමැතිය ලබා දී ඇත.

I. ගෙවීමට ඇති හිඟ වැටුප රු. ලක්ෂ 02 දක්වා වාරික 06 කින් ගෙවා නිම කිරීමට
II. ගෙවීමට ඇති හිඟ වැටුප රු. ලක්ෂ 02 සිට 05 දක්වා වාරික 18 කින් ගෙවා නිම කිරීමට
III. ගෙවීමට ඇති හිඟ වැටුප රු. ලක්ෂ 05 සිට 10 දක්වා වාරික 36කින් ගෙවා නිම කිරීමට
IV. ගෙවීමට ඇති හිඟ වැටුප රු. ලක්ෂ 10 ට වැඩි හිඟ වැටුප් වාරික 60 කින් ගෙවා නිම කිරීමට

02. මෙම ප්‍රතිලාභ ලබා දීම සඳහා 2016.04.07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් ආවරණය නොවූ රණවිරුවන් හඳුනා ගැනීමේදී පහත දක්වා ඇති සංයුතියෙන් යුත් කමිටුවක් මගින් අදාළ තොරතුරු විමර්ශනය කිරීමෙන් අනතුරුව අදාළ තෝරා ගැනීම් සිදු කළ හැකිවේ.

| | | | |
|---|---|---|---|
| I. | ආරක්ෂක ලේකම්තුමා විසින් නම් කරන ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙක් | - | සභාපති |
| II. | මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් | - | සාමාජික |
| III. | රාජ්‍ය පරි. හා කළ. නීති. හා සාම. අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් | - | සාමාජික |

By C of ...
DG(BG4F), DGP2, NAP
DGA, DGS
Info...

IV. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් - සාමාජික

V. ශ්‍රී ලංකා නාවික හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් - සාමාජික

VI. ශ්‍රී ලංකා ගුවන් හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් - සාමාජික

03. එලෙස හිඟ වැටුප් ලබන රණවිරුවන්ගේ දරුවන් හට උසස් අධ්‍යාපන කටයුතු සඳහා එකවර අධික වියදමක් දැරීමට සිදුවන අවස්ථාවලදී හෝ තමාගේ හෝ තම පවුලේ සාමාජිකයින්ගේ විශේෂිත රෝගාබාධයන් සම්බන්ධයෙන් එකවර විශාල වියදමක් දැරීමට හෝ වෙනත් විශේෂිත සාධාරණීකරණය කළ හැකි යම්කිසි හේතුවක් මත ඉල්ලීමක් කරනු ලැබුවහොත් හෝ ඉහත 02 හි සඳහන් යෝජිත කමිටුව මගින් ම තීරණයක් ගෙන එකවර ගෙවිය හැකි මුදල් ප්‍රමාණය තීරණය කළ යුතුවේ.

04. එබැවින් උක්ත කරුණ සම්බන්ධයෙන් හිඟ මුදල් ලැබීමට හිමිකම ඇති ත්‍රිවිධ හමුදා සේවා පුද්ගලයන්ගේ තොරතුරු කඩිනමින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

05. ඉහත අමාත්‍ය මණ්ඩල සංදේශයේ හා තීරණයේ පිටපත් ඔබගේ අවධානය පිණිස මේ සමඟ අමුණා ඇත.

විජිතා මායාදුන්න
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(ආ-3)
ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.